ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. UPLG/BD/BA/FS/HP/2023/06
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023 මැයි 16 දින.

ජාතික විගණන උප කාර්යාලය
වාණිජ වෙළඳ මධ්‍යස්ථානය
මහා නගර සභාව
බණ්ඩාරවෙල.

ලේකම්,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

**හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේදී වැඩ අවසන් කර තිබුණු ප්‍රාදේශීය සභාවට අයත් රු.616,865 ක ගොඩනැඟිලි ප්‍රාග්ධනිත නොකිරීම නිසා ඉඩම් හා ගොඩනැඟිලි හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම් වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී දියතලාව සතිපොළ භූමිය මැනුම් කිරීම සඳහා ගෙවා තිබුණු රු.120,000 ක් ප්‍රාග්ධනිත කර නොකිරීම හේතුවෙන් ඉඩම් හා සහ ගොඩනැඟිලි හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) ඉකුත් වර්ෂයේදී රු.1,959,540 ක වියදමක් දරා වැඩ නිම කර තිබුණු දියතලාව කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැඟිලි සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී කඩා ඉවත් කර රු.359,626 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණු පැරණි කාර්යාල ගොඩනැඟිල්ලේ වටිනාකම සහ ඉකුත් වර්ෂ වලදී කඩා ඉවත් කළ ගොඩනැඟිලි 03 ක එකතු වටිනාකම රු.484,215 ක් ගිණුම් වලින් ඉවත් නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැඟිලි මෙන්ම ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුම්වල ශේෂ එම වටිනාකමින් වැඩියෙන් දැක්වේ.

(v) 2018 මාර්තු 22 දින රු.396,750 කට මිලදීගෙන තිබුණු වැකුම් ක්ලීනරය සහ ප්‍රාදේශීය සභාව විසින් වර්තමානයේ පරිහරණය කෙරෙන මිලදීගත් දිනය හා වටිනාකම හඳුනාගත නොහැකි රවුටරය දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වේ.

(vi) දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවියයුතු ණය වාරික සහ පොලී මුදල රු.3,609,161 ක් ලෙස ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණද 2023 වර්ෂයේදී ගෙවීමට නියමිත ණය වාරික හා පොලී මුදල හඳුනාගෙන ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම දක්වා නොතිබුණි.

(vii) 2017 වර්ෂයට අදාළව ගව මස් වෙළඳසැලින් සභාවට අයවිය යුතු රු.41,080 ක ප්‍රමාද ගාස්තු ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ලැබිය යුතු ආදායම් හා සමුච්චිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

## 1.3 නොසැසඳූ ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ආධාර වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය රු.997,924 කින් නොසැසඳුනි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයනා ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනා ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.6 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පසුගිය වර්ෂය හා සැසඳුම් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.7 අනුකූල නොවීම්

### නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත<br>134(2) වගන්තිය | - | ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයෙන් පසු දියුණු කල ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු සීමාව පුළුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති) සංග්‍රහය<br>193 රීතිය | - | අයවැය ගත මූල්‍ය ප්‍රතිපාදන හා පරිපූරක සම්මත සමඟ සසඳා බලන කළ එක් එක් ආදායම් විෂය යටතේ වන අතිරික්ත සහ/හෝ ඌනතාවයක් සහ එක් එක් වැය විෂය යටතේ වන අතිරික්තයන්ගෙන් ඉතිරි කිරීම පිළිබඳ ප්‍රකාශනයන්, අතිරික්තයන් හෝ වියදම් නොකොට ඉතිරිව ඇති ශේෂය පිළිබඳව කරුණු පැහැදිලි කරන ප්‍රකාශනයන්ද සමඟ, සෑම වර්ෂයකම අවසානයේ එනම් දෙසැම්බර් 31 දිනට පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද එසේ කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති | 40,773 | ස්ථාන මාරු වී ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ ඇපකරුවන්ගෙන් අය කරගත යුතු වුවද, සේවකයින් 5 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| | 1980 අංක 47 දරන පාරිසරික පනතේ 23(ආ) වගන්තිය | - | නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනය/බැහැරලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |

**2. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,993,920 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,059,167 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,065,247 ක පිරිහීමක් වී තිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම්,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැ... 31 දි... හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 1,984,474 | 1,863,874 | 2,333,438 | (469,564) | 1,562,934 | 1,767,070 | 916,541 | 850... |
| (ii) | කුලී | 5,451,610 | 4,103,916 | 5,166,888 | (1,062,972) | 2,225,640 | 3,874,454 | 2,338,613 | 1,535... |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,102,300 | 1,232,590 | 616,934 | 615,656 | 1,154,700 | 916,370 | 915,870 | |
| (iv) | වෙනත් ආදායම් | 13,846,950 | 18,578,895 | 8,130,228 | 10,448,667 | 15,108,200 | 15,206,632 | 10,742,803 | 4,463,... |
| | එකතුව | 22,385,334 | 25,779,275 | 16,247,488 | 9,531,787 | 20,051,474 | 21,764,526 | 14,913,827 | 6,850,6... |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.25,779,275ක් වූ මුළු ආදායමෙන් වර්ෂය අවසාන වන රු.9,531,787 ක් අය කරගෙන නොතිබූ අතර, එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 36 ක් විය.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,998,384 ක් සහ මුද්දර ගාස්තු රු.10,239,689 ක් අය කරගෙන නොතිබුණි.

## 2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) වසර 02 ක කාලයක සිට පැවත එන කඩ කාමර 14 කින් රු.100,376 ක හිඟ කඩ කාමර කුලිය සහ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර 25 කින් හිඟ කුලී රු.104,550 ක් අය කරගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ වෙළඳ බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත 601ක් සමීක්ෂණ මගින් හඳුනාගත් බව සඳහන් කර ඇතත්, සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවූ අතර, ඉන් කර්මාන්ත 102 කින් වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව පරීක්ෂණයේ වූ කරුණු පහත දැක්වේ.

අරමුණු වලින් බැහැර ක්‍රියාකාරකම්

2014 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන වල යාන්ත්‍රික ඒකක පිහිටුවීම සඳහා ලබාදී තිබුණු ජී.අයි බට 104 ක් අරමුණුගත කාර්ය සඳහා යොමු නොකර 2021 ඔක්තෝබර් 18 දිනැති සභා තීරණයක් මත ප්‍රදේශයේ කෝවිල් 03 කට ජී.අයි බට 104 ක් පරිත්‍යාග කර තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ පනතේ 2 ඡේදයට අනුකූල නොවන ලෙස පසුගිය ප්‍රාදේශීය සභාවේ සභිකයින් 16 දෙනෙක් සමාලෝචිත වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය කම්කරු තනතුරට අදාලව අතිරික්තව පැවති සේවකයින් 6 දෙනෙක් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 2/2011 දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 4 – 1 ඡේදය අනුව පළාත් පාලන ආයතන විසින් අනියම් හා තාවකාලික පදනමින් බඳවා ගත් කාර්ය මණ්ඩල සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා දිය යුතු නමුත්, ප්‍රාදේශීය සභාවට 2013 සිට 2021 කාලය තුළ බඳවාගෙන තිබුණු සේවකයින් 11 දෙනෙකුට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා දී නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය අනුව යන්ත්‍ර හා උපකරණ යටතේ රු.37,700 ක් වූ වතුර මෝටර් 03 ක් දක්වා තිබුණද, භෞතික පරීක්ෂාවේදී වතුර මෝටර් 02 ක ඌනතාවයක් පැවතුනි. එම ඌනතාවයක් සම්බන්ධයෙන් පසු විපරම් සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ලීබඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණු රු.213,610 ක් වූ කොඩි කණු 06 ක්, කාර්යාල කැරකෙන පුටු 19 ක්, පරිගණක පුටු 11 ක් සහ ඇඳි සහිත පුටු 09 ක් භෞතිකව නිරීක්ෂණය නොවුනි.

## 3.5 අවිධිමත් ගණුදෙනු

2019 මැයි 08 දිනැති අංක 2122/29 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රීති අංක 01 හි ඡේදය අනුව ප්‍රාදේශීය සභා සභාපතිවරයා සභාවේ වාහනය යොදවා ගන්නේ නම්, මසකට ඉන්ධන ලීටර් 400 කට නොවැඩි ප්‍රමාණයක් සඳහා සභා අරමුදලින් වියදම් දැරිය හැකි වුවද, එයට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සභාවට අයත් කැබ් රථයක් සඳහා භාවිතා කර තිබුණු ඉන්ධන ලීටර් 1597.8 ක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබු අතර, අනුමත සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 726.5 ක් යොදා ගෙන තිබුණි. ඒ සඳහා සභා අරමුදලින් වැය කළ මුදල ආපසු අයකර ගත යුතුව තිබුණි.

## 4. ශ්‍රිණුම් කටයුතු භාවය හා යහපාලනය

### අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කල ආදායම් හා වියදම්,වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 03 ක සියයට 25 සිට සියයට 59 දක්වාද, වියදම් විෂයයන් 06 ක සියයට 24 සිට සියයට 105 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

කේ.එම්.ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

කේ.එම්. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

පිටපත - පළාත් පාලන කොමසාරිස් ( ඌව පළාත).